294.307 K16

SCAN

# මූලික බුදුසමයේ පැහැදිලි වන ගුරු ශිෂ්‍ය සම්බන්ධතා දර්ශනය

කාරගහඋල්පොත සුගතනන්ද හිමි.

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත්

කෙරෙන පරියේෂණ නිබන්ධයයි.

REFERENCE ONLY

අධ්‍යාපන අධ්‍යයන අංශය

මානව ශාස්ත්‍ර හා සමාජ අධ්‍යයන පීඨය

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

1998 ඔක්තෝබර්

OPEN UNIVERSITY

46768

46768

# සංක්ෂිප්තය


අධ්‍යාපන ක්‍රමයේ ඉතාමත්ම වැදගත්ම පියවර වන්නේ ගුරුවරයාත්, ශිෂ්‍යයාත් අතර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියයි. සියවස් විසිපහකට පෙර පහළ වූ බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ට ආගමික නායකයෙකු වශයෙන් ද, දාර්ශනිකයෙකු වශයෙන් ද වැදගත් වන්නේ උන් වහන්සේගේ දේශනා මාර්ගයයි. එය ලෞකික මෙන්ම ලෝකෝත්තර පරමාර්ථ සාරවත් කර ගැනීමට බෙහෙවින් බලපාන සම්බන්ධතාවකි. එකී සම්බන්ධය මුළු මහත් සමාජය කෙරෙහි අතිශයින්ම බලපෑවේය. භික්ෂු, භික්ෂුනී, උපාසක, උපාසිකා වශයෙන් සමාජය ප්‍රධාන 'ඒකක' හතරකට බෙදා දැක්වීම සමාජය ඉදිරි ගමනට මෙන්ම පුද්ගලයාගේ ඉදිරිගමනට උපකාරී විය. බුදු රදුන් විසින් දේශිත හා අනුදැක්නා ලද දේශනා මුල් බුදු සමයට අයත්ය. මෙම පර්යේෂණයේ මූලික හරය වන්නේ ද වෙනත් ආගම් සසඳා බැලීමක් හෝ ඒවා විවේචනය කිරීමක් නොවේ. හුදෙක් බුද්ධ භාෂිතය තුළින් ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව හෙලි පෙහෙළි කිරීමයි. එසේ ගත්විට මූලික බුදු සමයට අනුව කරුණු ඉදිරිපත් කිරීම මුල් පරිච්ඡෙදයෙන් අදහස් කරනු ලැබේ.

මූලික බුදු සමයේ එන ගුරු ශිෂ්‍ය සම්බන්ධ තාවන් විශ්ලේෂණය කිරීමේදී අරමුණු හතකි. පරමාර්ථ, අවශ්‍යතාවය, පදනම ආදී මූලික කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරණු ලැබේ. දීඝනිකායේ සිඟාලෝවාද සූත්‍රයේ ගුරු ශිෂ්‍ය සම්බන්ධය කේන්ද්‍ර කොට ඇත. එම කරුණු විනය පිටකය හා සූත්‍ර පිටකය ඇසුරු කරගෙන විශ්ලේෂණය කෙරේ.

අධ්‍යාපන ක්‍රියාවලියේ පැවැත්ම, පුද්ගල සංවර්ධනය බුදුසමයේ පිලිබිඹු වන ගුරු ශිෂ්‍ය සම්බන්ධ තාවයේ පරමාර්ථයයි. එය බෞද්ධ ආචාර ධර්මයෙහි මූලික පදනම වේ. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්‍ෂා, සතර බ්‍රහ්ම විහරණ මානසික පදනම වන අතර, දාන, ප්‍රිය වචන, අර්ථචර්‍යාව, සමානාත්මතාව යන සතර සංග්‍රහ වස්තුව

ක්‍රියාත්මක පදනම වේ. එය ක්‍රියාත්මක වීමේදී පුද්ගල නිදහස හා සිතීමේ අගයත් ප්‍රජාතන්ත්‍රවාදී සවභාවයත් මූලික බුදුදහමේ විස්තර වන ගුරු ශිෂ්‍ය සම්බන්ධතා දර්ශනය තුළින් ප්‍රකට වේ. ගුරුවරයාගෙන් ශිෂ්‍යයාටත්, ශිෂ්‍යයාගෙන් ගුරුවරයාටත් ඉටුවිය යුතු යුතුකම් පහකින් සමන්විත වේ. එමගින් අන්‍යොන්‍ය සම්බන්ධතාව මැනවින් පැහැදිලි කොට ඇත.

තෙවන පරිච්ඡේදයෙන් විස්තර කරනුයේ මූලාග්‍ර විමර්ශනයයි. ගුරු ශිෂ්‍ය සම්බන්ධතා දර්ශනයක් වශයෙන් ක්‍රම අටක් ඔස්සේ විස්තරාත්මකව ඉදිරිපත් කරනු ලැබේ. බුදු රජාණන් වහන්සේ අනුගමනය කරන ලද දේශනා හා සාකච්ඡා ක්‍රමවේදය තුළින් ගුරු කේන්ද්‍රීය මෙන්ම ශිෂ්‍ය කේන්ද්‍රීය සාර්ථක ඉගෙනුම්, ඉගැන්වීම් මගින් චරිත සංවර්ධනයට ලැබෙන අනුබලය විශ්ලේෂණයට ලක්කොට ඇත. එම අධ්‍යන ක්‍රම භාවිතය තුළින් පූර්ණ මනුෂ්‍යයෙකු කිරීමේ අඩිතාලම විස්තරව පැහැදිලි කරලීම අරමුණ හා අදහස විය.

සිව්වැනි පරිච්ඡේදයෙන් ගුරු ශිෂ්‍ය සම්බන්ධතා දර්ශනය මුල් බුදුසමයට අනුව විස්තර කොට ඇත. ලෝකයේ පහළ වූ ශ්‍රේෂ්ට දාර්ශනිකයෙකු හා ගුරුවරයෙකු වූ බුදුරජාණන් වහන්සේගේ විශ්ව සාධාරණ ඉගැන්වීම් දර්ශනයේ කාලීන වැදගත්කම පස්වැනි පරිච්ඡේදයෙන් විස්තර කරලීමට උත්සහ ගත්තෙමි. එහිදී අනාගත වැඩ ලොවක් සඳහා බුදු දහමේ අධ්‍යාපන ක්‍රම භාවිතය තුළින් ජාති, පංති, කුල ආදී නානාවිධ භේදයන්ගෙන් තොර විනය ගරුක, නීතිගරුක, සදාචාරය ගරු කරන ගුරු ශිෂ්‍ය පරපුරක් බිහිවනු දැක්ම එක් අරමුණකි. එම අරමුණ සඳහා ගොඩනගා ගැනීමට ගත් උත්සාහය මෙම පරිච්ඡේදයෙන් විස්තර කරනු ලැබේ.

OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

මූලික බුදු සමයේ පිළිබිඹු වන ගුරු ශිෂ්‍ය සම්බන්ධතා දර්ශනය පදනම් කොට ගෙන වර්තමාන අධ්‍යාපන පද්ධතිය සඳහා යෝග්‍ය ප්‍රායෝගික ආචාරධර්ම

පද්ධතියක් සකස් කිරීම අවශ්‍ය වේ. ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවේ අවශ්‍යතාව මෙන් ම මනා ගුරු සම්බන්ධයක තිබිය යුතු ලක්ෂණ පිළිබඳව ගුරුවරුන් මෙන්ම ශිෂ්‍යයන් ද, එමෙන්ම ප්‍රජාව ද දැනුවත් කිරීමේ විධිමත් ක්‍රියාමාර්ග සම්පාදනය කළ යුතුය.

මූලික බුදු සමය අධ්‍යාපන ක්ෂෙත්‍රයට අදාළ සියලු ආකාරයේම සමීක්ෂණවලට යෝග්‍ය වේ. අතීත සිද්ධීන්ගේ අවශේෂය වර්තමාන සහ අනාගත ලෝකයට මග පෙන්වීමට යොදා ගැනීම වර්තමාන විද්වතුන්ගේ වගකීම වේ. සමස්ථයක් වශයෙන්ම තම තමාගේ කාර්යභාරය නිවැරදිව තේරුම් ගෙනකටයුතු කිරීම ජාතියේ ප්‍රණාමයට හේතු වේ, යනු මගේ අදහසයි.